# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1981 අංක 61 දරන මහා නගර සභා හා නගර සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1081 ඔක්තෝබර් මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිල : ශත 65 යි　　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1981 අංක 61 දරන මහා නගර සභා හා නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 23/80.

**මහා නගර සභා ආඥාපනත සහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 61 දරන මහා නගර සභා හා නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

### I වන කොටස

2. (මෙහි මින් මතු මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) මහා නගර සභා ආඥාපනතේ 40 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ද) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **252 වන අධිකාරයේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(දද) 154අ වගන්තිය යටතේ පත් කරන ලද කමිටුවක් විසින් පිළියෙළ කරනු ලබන යෝජනා ක්‍රමයකට අනුකූලව, ඒ කමිටුව විසින් කරනු ලබන නිර්දේශයක් මත දිරි ගැන්වීමේ දීමනා ගෙවීම සඳහා සුදුසුකම් ලබන යම් නිවාස ස්ථානයක පදිංචිකරුවන්ට ඒ ගෙවීම සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව යම් මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලැබීම සඳහා ;";

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 145 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි "වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් දෙසියයක් නොඉක්මවන දඩයකට සහ නොකඩව කෙරෙන වරදක් සම්බන්ධයෙන් වන විට එක් එක් දිනය සඳහා රුපියල් පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද" යන වචන වෙනුවට, "වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට සහ නොකඩව කෙරෙන වරදක් සම්බන්ධයෙන් වන විට එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක් නොඉක්මවන අතිරේක දඩයකට ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. **ප්‍රධාන ප්‍රඥප්තියේ 145 වන වගන්තිය සංශෝධනය කිරීම.**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට සහ එක් එක් දිනය සඳහා රුපියල් එක් සියයක් නොඉක්මවන අතිරේක දඩයකට ද" යන වචන වෙනුවට, "වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට සහ එක් එක් දිනය සඳහා රුපියල් එක් දහසක් නොඉක්මවන අතිරේක දඩයකට ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. **ප්‍රධාන ප්‍රඥප්තියේ 146 වන වගන්තිය සංශෝධනය කිරීම.**

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි "වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට සහ නොකඩව කෙරෙන වරදක් සම්බන්ධයෙන් වන විට එක් එක් දිනය සඳහා රුපියල් පනහක් නොඉක්ම **ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2—ජ 57769—14,650 (81/07)

වන අතිරේක දඩයකට ද" යන වචන වෙනුවට, "වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට සහ නොකඩව කෙරෙන වරදක් සම්බන්ධයෙන් වන විට එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක් නොඉක්මවන අතිරේක දඩයකට ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 148 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 148 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි "වරදකරු කරනු ලැබූ කල්හි එක් එක් දිනය සඳහා රුපියල් දෙසියයක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට, "වරදකරු කරනු ලැබූ කල්හි එක් එක් දිනය සඳහා රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

148අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

7. 148 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 148අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලබන වැසීමේ ආඥාව.

148අ. (1) මේ ආඥාපනත හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව තැනැත්තකු යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සඳහා යම් ස්ථානයක් පාවිච්චි කිරීමේ වරදට යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ, තමා විසින් හෝ තමා වෙනුවෙන වෙනත් යම් තැනැත්තකු විසින් යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සඳහා ඒ ස්ථානය ම පාවිච්චි කිරීම නොකඩව කරගෙන යන අවස්ථාවක, නගරාධිපතිවරයා හෝ කොමසාරිස්වරයා හෝ අවස්ථාවෝචිත පරිදි තත් කාර්යය සඳහා ඒ නගරාධිපතිවරයා හෝ ඒ කොමසාරිස්වරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් වැසීමේ ආඥාවක් සඳහා කරන ලද ඉල්ලීමක් මත, ඒ තැනැත්තා සභාවෙන් බලපත්‍රයක් ලබා ගන්නා තුරු මහෙස්ත්‍රාත්වරයකු විසින් ඒ ස්ථානයෙහි වූ ඒ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දැමීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී නගරාධිපතිවරයා, කොමසාරිස්වරයා හෝ අවස්ථාවෝචිත පරිදි තත් කාර්යය සඳහා ඒ නගරාධිපතිවරයා හෝ ඒ කොමසාරිස්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් නිකුත් කරන ලද සහතිකයක්, ඒ සහතිකයේ සඳහන් තැනැත්තා බලපත්‍රයක් නොමැතිව යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සඳහා ඒ ස්ථානය පාවිච්චි කිරීම නොකඩව කරගෙන යන බව දක්වමින් ඒ සහතිකයේ ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන්, බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද වැසීමේ ආඥාවකට අනුකූලව ක්‍රියා කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලබන යම් අවස්ථාවක, ඒ ස්ථානයෙහි වූ යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වසා දැමීමට නියම කෙරෙන හා බලය දෙන ආඥාවක් මහෙස්ත්‍රාත්වරයා විසින් අධිකරණයේ පිස්කල්වරයාට වහා ම කරනු ලැබිය යුතු අතර, ඒ ආඥාවෙහි සඳහන්, ඒ ආඥාව නිකුත් කරන ලද දිනයේ සිට සම්පූර්ණ දින තුනකට කලින් වූ හෝ සම්පූර්ණ දින හතකට පසු දිනයක් නොවන දිනයකට පෙර ඒ පිස්කල් වරයා විසින් ඒ අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය. ඒ ස්ථානයෙහි වූ යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වසා දැමීම සඳහා එකී පිස්කල්වරයා හෝ තත්කාර්යය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් පොලිස් නිලධරයකු විසින් අවශ්‍ය යයි සලකන යම් සහායකයින් ද සමඟ ස්ථානයට ඇතුළුවීමට ඒ ආඥාව ඒ පිස්කල්වරයාට හෝ ඒ නිලධරයාට ප්‍රමාණවත් අධිකාරයක් වන්නේ ය.".

8. 154 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 154අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— 154අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

" දිරි ගැන්වීමේ දීමනා ගෙවීම.

154අ. (1) නිවාස ස්ථාන නඩත්තු කිරීම පිළිබඳව යෝජනා ක්‍රමයක් සකස් කිරීමේ කාර්යය සඳහා සහ දිරිගැන්වීමේ දීමනා ගෙවීම සඳහා සුදුසුකම් ලබන ඒ ස්ථානවල පදිංචිකරුවන්ට එවැනි ගෙවීම් කිරීම පිණිස නිර්දේශ කිරීම සඳහා සභික යන් සයදෙනකුට නොඅඩු ගණනකින් සමන්විත වූ කමිටුවක් මහා නගර සභාවක් විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යෝජනා ක්‍රමයක් සකස් කිරීමේ දී සහ යම් නිවාස ස්ථාන යක පදිංචිකරුවකුට දිරි ගැන්වීමේ දීමනාවක් ගෙවීම සඳහා යම් නිර්දේශයක් කිරීමේ දී කමිටුව විසින් පහත දක්වෙන දේ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය :—

(අ) නිවාස ස්ථාන හොඳින් නඩත්තු කර, ශක්ති සම්පන්න, පවිත්‍ර හා සෞඛ්‍යයට හිතකර තත්ත්වයකින් පවත්නා බව ; සහ

(ආ) පදික වේදිකාව ඇතුළු වීදිය සහ ඒ ස්ථානය ඉදිරිපස හා ඒ ස්ථානයට යා වූ සියලු මතුපිට කාණු පිරිසිදුව හා යම් අපද්‍රව්‍යය කින් තොරව තබා ඇති බව.

(3) කමිටුව විසින්, ස්වකීය නිර්දේශ කිරීමේ කාර්යය සඳහා දවසේ සියලු යුක්තිසහගත වේලාවන්හි දී පදිංචිකරුගේ කැමැත්ත ඇතිව යම් නිවාස ස්ථානයකට ඇතුළු වීම සහ පරීක්ෂා කිරීම ද ඒ ස්ථානයේ පදිංචිකරුගෙන් යම් තොරතුරක් නිසැකව දැන ගැනීම ද කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 188 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 188 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි (ජ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ජජ) 154අ වගන්තිය යටතේ ස්ථානවල පදිංචිකරුවන් වෙත දිරිගැන්වීමේ දීමනා වශයෙන් ගෙවීම සඳහා සභාව විසින් වෙන් කරනු ලබන සියලු ම මුදල්;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 267 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 267 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(3) අතුරු ව්‍යවස්ථා කඩකිරීම සම්බන්ධයෙන් ඒ අතුරු ව්‍යවස්ථා මගින් පහත දැක්වෙන දණ්ඩන සඳහා විධිවිධාන සලස්වනු ලැබේ:—

(අ) පළමුවන වරදක් සම්බන්ධයෙන් රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයක්;

(ආ) දෙවන හෝ තදනන්තර වරදක් සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයක්; සහ

(ඇ) නොකඩව කෙරෙන වරදක් සම්බන්ධයෙන් වන විට, වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩ කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුව හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහා ම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයක්.".

268අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

11. 268 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 268අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"වැරදි සමථයකට පත් කිරීමේ බලය.

268අ. (1) 272 වන වගන්තියේ (5) වන උප වගන්තිය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යම් තැනැත්තකු විසින් කඩ කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා 267 වන වගන්තිය යටතේ කලින් වරදකරු කරනු ලැබ නැත්නම්, වරද සමථයකට පත් කරන ලෙස ඒ වරදකරු ඉල්ලා සිටින්නේ නම්, නගරාධිපතිවරයා විසින්, 267 වන වගන්තිය යටතේ ඒ වරද සඳහා නියම කළ හැකි උපරිම දඩයෙන් හතරෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් සඳහා ඒ වරද සමථයකට පත් කරනු ලැබිය යුතු අතර එවැනි යම් වරදකරු

වකුට විරුද්ධව නඩු පැවරීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, නඩු තීන්දුව දීමට පෙර කවර වූ හෝ විටක නගරාධිපතිවරයා විසින් අධිකරණයේ කැමැත්ත ඇතිව ඒ වරද සමථයකට පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නගරාධිපතිවරයා විසින් පිළිගන්නා ලද යම් මුදල් ප්‍රමාණයක් නාගරික අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 312 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 312 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"වරද සඳහා දණ්ඩනය.

312. අන්‍යාකාර විධිවිධාන සලසා ඇතොත් හැර, මේ ආඥාපනතේ විධිවිධාන යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම එවැනි සෑම වරදක් සඳහා ම රුපියල් එක් දහසක් නොඉක්ම වන දඩයකට යටත් විය යුතු අතර, වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ ඒ වරද සම්බන්ධයෙන් අවධානය යොමු කරවමින් නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුව හෝ නොකඩව කෙරෙන වරදක් සම්බන්ධයෙන් වන විට, වරද කරගෙන යනු ලබන එක් එක් දිනයක් සඳහා රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.".

## II වන කොටස

13. (මෙහි මින් මතු මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) නගර සභා ආඥාපනතේ 36 වන වගන්තියේ (එ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 255 වන අධිකාරයේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(එඑ) 209අ වගන්තිය යටතේ පත් කරන ලද කමිටුවක් විසින් පිළියෙළ කරනු ලබන යෝජනා ක්‍රමයකට අනුකූලව, ඒ කමිටුව විසින් කරනු ලබන නිර්දේශයක් මත දිරිගැන්වීමේ දීමනා ගෙවීම සඳහා සුදුසුකම් ලබන යම් නිවාස ස්ථානයක පදිංචිකරුවන්ට ඒ ගෙවීම සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව යම් මුදල් ප්‍රමාණයන් වෙන් කරනු ලැබීම සඳහා ;".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි "රුපියල් දෙසියයක් නොඉක්මවන දඩයකින් සහ සෑම දිනයක් සඳහා ම රුපියල් පනහක් නොඉක්මවන තවදුරටත් වූ දඩයකින් දඬුවම් කළ යුතු" යන වචන වෙනුවට, "රුපියල් හය සියයක් නොඉක්මවන දඩයකින් සහ සෑම දිනයක් සඳහා ම රුපියල් පන්සියයක් නොඉක්මවන තවදුරටත් වූ දඩයකින් දඬුවම් කළ යුතු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තිය සංශෝධනය කිරීම.

128අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**15.** 128 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 128අ වගන්තිය යනුවෙන් බලපැවැත්විය යුතු ය:—

" මහේස්ත්‍රාත්වරයා විසින් කරනු ලබන වැසීමේ ආඥාව.

128අ. (1) මේ ආඥාපනත හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව යම් තැනැත්තකු, යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සඳහා යම් ස්ථානයක් පාවිච්චි කිරීමේ වරදට යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ, තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙනත් තැනැත්තකු විසින් ඒ කර්මාන්තය හෝ ව්‍යාපාරය සඳහා ඒ ස්ථානය පාවිච්චි කිරීම නොකඩවා කර ගෙන යන අවස්ථාවක, සභාපතිවරයා, ලේකම්වරයා හෝ අවස්ථාවෝචිත පරිදි තත් කාර්යය සඳහා සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් බලය දෙන ලද තැනැත්තකු විසින් වැසීමේ ආඥාවක් සඳහා කරන ලද ඉල්ලීමක් මත, මහේස්ත්‍රාත්වරයකු විසින් ඒ තැනැත්තා සභාවෙන් බලපත්‍රයක් ලබා ගන්නා තුරු ඒ ස්ථානයෙහි ඒ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දැමීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී සභාපතිවරයා, ලේකම්වරයා හෝ අවස්ථාවෝචිත පරිදි ඒ සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් නිකුත් කරන ලද සහතිකයක්, ඒ සහතිකයේ සඳහන් තැනැත්තා බලපත්‍රයක් නොමැතිව යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සඳහා ඒ ස්ථානය දිගටම පාවිච්චි කරන බව දක්වමින් එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද වැසීමේ ආඥාවකට අනුකූලව ක්‍රියා කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ ස්ථානයෙහි වූ යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වසා දැමීමට නියම කෙරෙන හා බලය දෙන ආඥාවක් මහේස්ත්‍රාත්වරයා විසින් අධිකරණයේ පිස්කල්වරයාට වහාම කරනු ලැබිය යුතු අතර, ඒ ආඥාවෙහි සඳහන්, ඒ ආඥාව නිකුත් කරන ලද දිනයේ සිට සම්පූර්ණ දින තුනකට කලින් වූ හෝ සම්පූර්ණ දින හතකට පසු දිනයක් නොවන දිනයකට පෙර. ඒ පිස්කල්වරයා විසින් ඒ අනුව ක්‍රියා කරනු ලැබිය යුතු ය. ඒ ස්ථානයෙහි වූ යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වසා දැමීම සඳහා එකී පිස්කල්වරයා හෝ

තත් කාර්යය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් පොලිස් නිලධරයකු විසින් අවශ්‍යයයි සලකන යම් සහායකයින් ද සමඟ ස්ථානයට ඇතුළුවීමට ඒ ආඥාව ඒ පිස්කල්වරයාට හෝ ඒ නිලධරයාට ප්‍රමාණවත් අධිකාරයක් වන්නේ ය.".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 153 වන වගන්තියේ (2) වන උප වගන්තියෙහි "එවැනි කඩ කිරීමක් සංයුක්ත වන යම් එක් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා රුපියල් දෙසිය පනහක් නොඉක්මවන ඒ දඩයට සහ නොකඩව කෙරෙන කඩ කිරීමක් සම්බන්ධයෙන් වන විට සෑම දිනයක් සඳහා ම රුපියල් විසිපහක් නොඉක්මවන අතිරේක දඩයකට ද" යන වචන වෙනුවට, "එවැනි කඩ කිරීමක් සංයුක්ත වන යම් එක් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා රුපියල් හත්සිය පනහක් නොඉක්මවන ඒ දඩයට සහ නොකඩව කෙරෙන කඩ කිරීමක් සම්බන්ධයෙන් වන විට, සෑම දිනයක් සඳහා ම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 153 වන වගන්තිය සංශෝධනය කිරීම.

17. 153 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 153අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

153අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම

"වැරදි සමථයකට පත් කිරීමේ බලය.

153අ. (1) 157 වන වගන්තියේ (9) වන උප වගන්තිය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යම් තැනැත්තකු විසින් කඩ කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා 153 වන වගන්තිය යටතේ කලින් වරදකරු කරනු ලැබ නැත්නම්, වරද සමථයකට පත්කරන ලෙස වරදකරු ඉල්ලා සිටින්නේ නම්, සභාපතිවරයා විසින්, 153 වන වගන්තිය යටතේ ඒ වරද සඳහා නියම කළ හැකි උපරිම දඩයෙන් හතරෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් සඳහා ඒ වරද සමථයකට පත් කරනු ලැබිය යුතු අතර එවැනි යම් වරදකරුවකුට විරුද්ධව නඩු පැවරීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, නඩු තීන්දුව දීමට පෙර කවර වූ හෝ විටක සභාපතිවරයා විසින් අධිකරණයේ කැමැත්ත ඇතිව ඒ වරද සමථයකට පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සභාපතිවරයා විසින් පිළිගන්නා ලද යම් මුදල් ප්‍රමාණයක් සභාවේ අරමුදලට බැර කළ යුතු ය.".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඉඉ) 200අ වගන්තිය යටතේ ස්ථානවල පදිංචිකරුවන් වෙත දිරිගැන්වීමේ දීමනා වශයෙන් ගෙවීම සඳහා සභාව විසින් වෙන් කරනු ලැබිය හැකි සියලුම මුදල් ; තව ද".

209අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුලත් කිරීම.

**19.** 209 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 209අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

" දිරිගැන්වීමේ දීමනා ගෙවීම.

209අ. (1) නිවාස ස්ථාන නඩත්තු කිරීම පිළිබඳ යෝජනා ක්‍රමයක් සකස් කිරීමේ කාර්යය සඳහා සහ දිරිගැන්වීමේ දීමනා ගෙවීම සඳහා සුදුසුකම් ලබන ඒ ස්ථානවල පදිංචිකරුවන්ට එවැනි ගෙවීම් කිරීම පිණිස නිර්දේශ කිරීම සඳහා සභිකයන් හයදෙනකුට නොඅඩු ගණනකින් සමන්විත වූ කමිටුවක් නගර සභාවක් විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යෝජනා ක්‍රමයක් සකස් කිරීමේ දී සහ යම් නිවාස ස්ථානයක පදිංචිකරුවකුට දිරිගැන්වීමේ දීමනාවක් ගෙවීම සඳහා යම් නිර්දේශයක් කිරීමේ දී කමිටුව විසින් පහත දැක්වෙන දේ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය :—

(අ) නිවාස ස්ථාන හොඳින් නඩත්තු කර, ශක්ති සම්පන්න, පවිත්‍ර හා සෞඛ්‍යයට හිතකර තත්ත්වයකින් පවත්නා බව; සහ

(ආ) පදික වේදිකාව ඇතුළු වීදිය සහ ඒ ස්ථානය ඉදිරිපස හා ඒ ස්ථානයට යා වූ සියලු මතුපිට කාණු පිරිසිදුව හා යම් අපද්‍රව්‍යයකින් තොරව තබා ඇති බව.

(3) කමිටුව විසින්, ස්වකීය නිර්දේශ කිරීමේ කාර්යය සඳහා දවසේ සියලු යුක්ති සහගත වේලාවන්හි දී පදිංචිකරුගේ කැමැත්ත ඇතිව යම් නිවාස ස්ථානයකට ඇතුළුවීම් සහ පරීක්ෂා කිරීම ද ඒ ස්ථානයේ පදිංචිකරුගෙන් යම් තොරතුරක් නිසැකව දැන ගැනීම ද කරනු ලැබිය හැකි ය.".